සියලු ම හිමිකම් ඇවිරිණි

SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**අවසාන විභාගය - 2011 ජූලි**

2011-07-17
පස්වරු
[2.00 – 5.00]

# (61) විගණනය

Auditing

**කාලය: පැය 03 යි.**

පිටු ගණන: 04
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්:**
  - *(1) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු ය.***
  - *(2) ඉල්ලුම් කරන ලද **මාධ්‍යයට** අදාළව, **එක් භාෂාවකින්** පමණක්, ඔබ වෙත සපයන ලද **පොත්වල** උත්තර ලියන්න.*
  - *(3) ගණක යන්ත්‍ර භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - *(4) ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත් ඒවා පැහැදිලිව සඳහන් කරන්න.*
  - *(5) ලකුණු 100.*

---

**01.** (a) අවසන් විගණනය (final audit) හා අතුරු විගණනය (interim audit) අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(b) විගණනයක විෂය පථය තීරණය කරන සාධක තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

(c) විගණන අවදානමේ සංරචකයන් (components) මොනවාද? (ලකුණු 03)

(d) මුදලට අගය විගණනය (value for money) යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(e) ගිණුම්කරණ ශිල්පියෙකුගේ වෘත්තීය චර්යාව පාලනය කෙරෙන මූලික මූලධර්ම (Fundamental Principles) හතරක්(04) සඳහන් කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 17)

**02.** (a) (i) "අභ්‍යන්තර පාලනය" යන පදයෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 02)

(ii) "සේවාදායකයාගේ ආයතනයේ යෝග්‍ය අභ්‍යන්තර පාලන හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම විගණකගේ වගකීම වේ".

ඉහත සඳහන් ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 04)

(b) **සීමාසහිත උඩරට පොදු සමාගම** සෙල්ලම් බඩු නිෂ්පාදනය කර විකිණීමේ ව්‍යාපාරයක නිරතව සිටී. ඔබ **සීමාසහිත උඩරට පොදු සමාගමේ** අභ්‍යන්තර විගණනය භාර ජ්‍යෙෂ්ඨ නිලධාරියා වේ. උපකරණ මිලදී ගැනීම සම්බන්ධයෙන් සමාගමේ ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන පටිපාටිය අධ්‍යයනය කර ලේඛනගත කරන ලෙස ඔබ, ඔබගේ විගණන සහායකයෙකු වන **නුවන්ට** උපදෙස් දෙන ලදී. **නුවන්** එහි දැනට පවතින ක්‍රියා පටිපාටීන් පහත සඳහන් ලෙස ලේඛනගත කර ඇත.

උපකරණ මිලදී ගැනීම සඳහා අවශ්‍යතාවයක් පැන නැගුන විට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් **සීමාසහිත උඩරට පොදු සමාගමේ** සහකාර මිලදී ගැනීම් කළමනාකරු වෙත වාචිකව ඉල්ලීමක් කරනු ලැබේ. සහකාර මිලදී ගැනීමේ කළමනාකරු අභිලාශී සැපයුම්කරුවන්ට (prospective suppliers) දුරකතනයෙන් කතාකර භාණ්ඩ තිබේද යන්න විමසුම් කර, ඉදිරිපත් කරන මිල ගණන් පරීක්ෂාකර ඇගයීමද ඔහු විසින්ම ඉටු කරයි. අඩුම මිල ගණන ඉදිරිපත් කළ සැපයුම්කරුවන්ගෙන් උපකරණ මිලදී ගනී. සැපයුම්කරුවන්ගෙන් ඍජුව ඉන්වොයිසියක් ලැබුණු පසු පමණක් මුදල් දෙපාර්තමේන්තුව මුදල් ගෙවනු ලැබේ.

(i) **සීමාසහිත උඩරට පොදු සමාගමේ** උපකරණ මිලදී ගැනීම සම්බන්ධව ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලනයේ ඇති දුර්වලතා හතරක්(04) හඳුනාගෙන දක්වන්න. (ලකුණු 04)

(ii) **සීමාසහිත උඩරට පොදු සමාගමේ** උපකරණ මිලදී ගැනීම සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර පාලන පටිපාටීන් වැඩි දියුණු කිරීම සඳහා යෝජනා හතරක්(04) ලැයිස්තුගත කරන්න.
(ලකුණු 04)
(මුළු ලකුණු 14)

03. (a) විගණන කාර්ය (වැඩ) පත්‍රිකා (working papers) තිබීමෙන් විගණකයෙකුට ඇති වාසි හතරක්(04) ලැයිස්තුගත කරන්න. (ලකුණු 04)

(b) (i) සේවයේ යෙදවීමේ (බඳවා ගැනීමේ) කොන්දේසි පිළිබඳව සේවාදායකයෙකු සමග එකඟතාවයකට පැමිණීම විගණනයෙකුට වැදගත් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.
(ලකුණු 03)

(ii) සේවයේ යෙදවීමේ ලිපියක (letter of engagement) අන්තර්ගත කළ හැකි ප්‍රධාන කරුණු හතරක්(04) ලැයිස්තුගත කරන්න. (ලකුණු 04)

(c) (i) "වංචා" (Fraud) සහ "වැරදි" (Error) යන පද නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) "සේවාදායකයාගේ ආයතනයේ වංචා සහ වැරදි සොයා ගැනීම හා වළක්වා ගැනීම විගණකගේ වගකීම වේ".

ඉහත සඳහන් ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 03)
(මුළු ලකුණු 18)

04. (a) (i) විද්‍යුත් දත්ත සැකසුම් පද්ධතියක ඇති පොදු පාලනයන්හි (general controls) අරමුණු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) විද්‍යුත් දත්ත සැකසුම් පද්ධතියක භාවිත කළ යුතු පොදු පාලන හතරක්(04) සඳහන් කරන්න. (ලකුණු 04)

(b) **සීමාසහිත රන්හිරු පොදු සමාගම** සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාරික කටයුතුවල යෙදී සිටින අතර තරුපහේ හෝටලයක් නුවර පවත්වාගෙන යයි. **සීමාසහිත රන්හිරු පොදු සමාගමේ** 2011 මාර්තු 31 දිනට ගෙවිය යුතු ගිණුම්වල එකතුව රුපියල් මිලියන 89.5 කි.

**ඔබ විසින්, සීමාසහිත රන්හිරු පොදු සමාගමේ** ගෙවිය යුතු ගිණුම් සත්‍යාපනය කිරීම සඳහා ඉටු කරනු ලබන වැදගත් විගණන පටිපාටීන් හතරක්(04) ලැයිස්තුගත කරන්න. (ලකුණු 04)

(c) පහත සඳහන් අයිතමයන්ගේ **අයිතිය, පැවැත්ම** සහ **පිරිවැය / ඇගයීම** තහවුරු කර ගැනීම සඳහා විගණක විසින් ලබා ගත යුතු විගණන සාක්ෂි දක්වන්න.

(i) පිරියත හා උපකරණ.

(ii) ස්ථාවර තැන්පතු.

(iii) තොග.

(iv) නිල ලැයිස්තුගත සමාගම් හි කොටස්වල ආයෝජන. (ලකුණු 12)
(මුළු ලකුණු 22)

**05.** (a) ඔබ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයක විගණන සහායකයෙකු ලෙස සේවය කරයි. ඔබේ කළමනාකරු විසින්, තෝරා ගත් ගනුදෙනුකරුවන්ට ණය පදනම මත භාණ්ඩ විකුණන **සීමාසහිත ස්මෝල් පොදු සමාගමේ** ලැබිය යුතු වෙළෙඳ ගිණුම් සත්‍යාපනය කිරීමේ කාර්යය ඔබට පවරා ඇත. **සීමාසහිත ස්මෝල් පොදු සමාගම** එහි ගනුදෙනුකරුවන්ට ණය නිරවුල් කිරීම සඳහා දින 60 ක ණය කාලයක් ලබා දේ.

**සීමාසහිත ස්මෝල් පොදු සමාගමෙහි** ලෙජරයේ 2011 මාර්තු 31 දිනට දිස්වන පහත සඳහන් **සීමාසහිත මීඩියම් සමාගමේ** ලැබිය යුතු වෙළෙඳ ගිණුම ඔබගේ සමාලෝචනය සඳහා ලැබී ඇත.

**ලැබිය යුතු වෙළෙඳ ගිණුම් - සීමාසහිත මීඩියම් සමාගම.**

| දිනය | විස්තරය | මුදල, රු.('000) | දිනය | විස්තරය | මුදල, රු.('000) |
|---|---|---|---|---|---|
| 2010.04.01 | ඉදිරියට ගෙනා ශේෂය | 6,730 | 2010.04.20 | මුදල් | 4,560 |
| 2010.04.10 | විකුණුම් (ඉන්වොයිස් අංක 517) | 3,450 | 2010.05.10 | මුදල් | 2,170 |
| 2010.05.24 | විකුණුම් (ඉන්වොයිස් අංක 710) | 2,770 | 2010.07.10 | මුදල් (ඉන්වොයිස් අංක 710) | 2,770 |
| 2010.07.05 | විකුණුම් (ඉන්වොයිස් අංක 9257) | 5,880 | 2010.10.15 | මුදල් (ඉන්වොයිස් අංක 1120) | 1,635 |
| 2010.09.02 | විකුණුම් (ඉන්වොයිස් අංක 1120) | 1,635 | 2010.10.18 | විකුණුම් (ඉන්වොයිස් අංක 9257) | 5,880 |
| 2010.11.15 | විකුණුම් (ඉන්වොයිස් අංක 1443) | 6,450 | 2011.03.29 | බොල් ණය | 3,871 |
| 2011.01.02 | විකුණුම් (ඉන්වොයිස් අංක 1671) | 3,871 | 2011.03.31 | ශේෂය ඉදිරියට ගෙන ගියා | 6,208 |
| 2011.03.15 | විකුණුම් (ඉන්වොයිස් අංක 1819) | 4,438 | | | |
| 2011.03.25 | ණයහිමි ලෙජරය සමග ප්‍රතිසටහන | 1,850 | | | |
| 2011.03.25 | දුන් වට්ටම් | 20 | | | |
| | | **37,094** | | | **37,094** |
| 2011.04.01 | ඉදිරියට ගෙන ගිය ශේෂය | 16,208 | | | |

**ඔබ විසින්,** ඉහත සඳහන් **සීමාසහිත මීඩියම් සමාගමේ** ලැබිය යුතු වෙළෙඳ ගිණුම විගණනය කිරීමේදී විශේෂ අවධානය යොමුකළ යුතු කරුණු (issues) හතරක්(04) සඳහන් කරන්න. (ලකුණු 06)

(b) ඔබ **සීමාසහිත එක්ස්.වයි.ඉසෙඩ්. (පෞද්ගලික) සමාගමේ** මූල්‍ය ප්‍රකාශ විගණනය කරන කණ්ඩායමේ සාමාජිකයෙකි. ඔබ විසින් පහත සඳහන් විගණන පටිපාටින් ඉටුකරනු ලබන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.

(i) **සීමාසහිත එක්ස්.වයි.ඉසෙඩ්. (පෞද්ගලික) සමාගම** කාර්යාල ගොඩනැගිල්ලේ හිමිකරු සමග එළඹී ඇති ගෙවල් කුලී ගිවිසුම පරීක්ෂා කිරීම.

(ii) මුදල් වර්ෂය අවසානයෙන් පසු ආසන්නතම කාලය තුල (immediately after the end) නිකුත් කරන ලද විකුණුම් ඉන්වොයිස් සියුම් ලෙස පරීක්ෂා කිරීම.

(iii) **සීමාසහිත එක්ස්.වයි.ඉසෙඩ්. (පෞද්ගලික) සමාගමේ** ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා ඇති වාහන ලියාපදිංචි කිරීමේ පොත් සමාලෝචනය කිරීම. (ලකුණු 06)

(මුළු ලකුණු 12)

**06.** (a) අස්තිත්වයක අඛණ්ඩ පැවැත්මේ යෝග්‍යතාවය ඇගයීම සම්බන්ධව විගණකගේ වගකීම කුමක්ද? (ලකුණු 03)

(b) "මූල්‍ය ප්‍රකාශවල ගැලපීමක් හෝ හෙළිදරව් කිරීමක් අවශ්‍ය විය හැකි විගණකගේ වාර්තාවේ දිනය දක්වා සියළුම සිදුවීම් හඳුනාගත් බවට තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට, සැලසුම් කළ විගණන පටිපාටීන් විගණක විසින් ක්‍රියාත්මක කළ යුතුය".

මූල්‍ය ප්‍රකාශවල ගැලපීමක් හෝ හෙළිදරව් කිරීමක් අවශ්‍ය වන පසුව ඇතිවන සිදුවීම් (subsequent events) හඳුනාගත හැකිවීම සඳහා ක්‍රියාත්මක කළ හැකි විගණන පටිපාටීන් හතරක්(04) ලැයිස්තුගත කරන්න. (ලකුණු 04)

(c) විගණක, මූල්‍ය ප්‍රකාශ මත අහිතකර මතයක් (adverse opinion) ප්‍රකාශ කරනු ලබන්නේ කුමන තත්ත්වයන් (circumstance) යටතේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(d) (i) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකාවේ විගණකාධිපතිවරයා සතු අයිතීන් හෝ බලතල (rights or powers) තුනක්(03) දක්වන්න. (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාවේ විගණකාධිපතිවරයා විසින් ගිණුම් විගණනය කරනු ලබන ආයතන / විශේෂිත ආයතන වර්ග හතරක(04) ලැයිස්තුවක් දක්වන්න.

(ලකුණු 04)

(මුළු ලකුණු 17)

- o0o -